ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No .

දිනය / திகதி / Date. 2023 - 02 - 24

පැමිණිලි පාර්ශවය = එන්.යූ. ලියනගේ මයා,
නො 05/2, මහබුත්ගමුව,
කොටිකාවත්ත, අංගොඩ.

වගඋත්තර පාර්ශවය = 01. ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය,
කොළඹ 01.

02. යුද්ධ හමුදාපති,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

03. අධ්‍යක්ෂ ජනරාල්,
කලමණාකරණ සේවා දෙපාර්තමේන්තුව,
කොළඹ 01.

<u>පැමිණිලි අංකය</u> : <u>HRC/2499/17</u>

**පෙත්සම :-**

පෙත්සම්කරු ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නීති නිලධාරී ලෙස සේවය කරමින් සිටියදී, මෙම පෙත්සම ගොනු කර ඇති අතර, තම පෙත්සම තුළින් දක්වා ඇත්තේ, 2017 වසරේදී අයවැය වාර්තාව ඉදිරිපත් කිරීමේදී රජය විසින් නිකුත් කරන ලද නීති නිලධාරීන් සඳහා වූ වෘත්තිය දීමනාව වගඋත්තරකරුවන් විසින් ලබාදීම පැහැරහැර ඇති බවද ශ්‍රී ලංකා ජනරජය වෙනුවෙන් විවිධ දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ, අධිකාරී හා විවිධ රාජ්‍ය ආයතන විසින් නීති නිලධාරීන් හට වෘත්තිය දීමනාව ඉහත කී අයවැය වාර්තාවට අනුව ගෙවමින් තිබියදී පෙත්සම්කරු ඇතුළු යුද්ධ හමුදාවේ සේවය කරන එක් පිරිසකට පමණක් එය ගෙවීමෙන් හා යුද්ධ හමුදාවේ තවත් නීති නිලධාරීන් කොටසකට පමණක් එය නොගෙවීම තුළින් නීතිය ඉදිරියේ වෙනස් කමකට ලක් කර ඇති බවයි. මේ



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman } 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone } 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary } 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

සම්බන්ධව වගඋත්තරකරුවන්ට හා විවිධ රාජ්‍ය ආයතන වෙත ද ශ්‍රී ලංකා නීතිඥ සංගමය වෙත ද පෙත්සම්කරුවන් විසින් කරුණු දක්වා වෘත්තීය දීමනාව ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීම් නොසලකාහැර කටයුතු කර ඇති බව ද යුද්ධ හමුදාවේ නීති අංශය අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරන නීති නිලධාරි හට පවා වෘත්තීය දීමනාව ගෙවීම් පැහැරහැර ඇතත්, අධ්‍යක්ෂ නීති යටතේ පාලනය වන නීති නිලධාරීන් හට ද මෙම වෘත්තීය දීමනාව ලබාදෙන බවද පෙත්සම තුළින් වැඩිදුරටත් පෙන්වා දී ඇත. ඒ අනුව පෙත්සම විභාගයට ගෙන මූලික අයිතිවාසිකම් කඩවූ බවට නිර්දේශයක් සහ 2017 වසරේ සිට හිමිවියයුතු වෘත්තීය දීමනාව ලබාදීමට කටයුතු කර දෙන ලෙස පෙත්සම තුළින් ඉල්ලා ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් දක්වා ඇත්තේ, 2017 අයවැය යෝජනා අනුව ආරක්ෂක අංශ වල. නීති ක්ෂේත්‍රයේ රැකියාවලට බඳවා ගත් නීතිඥවරුන් හට වෘත්තීය දීමනාව ලබාදීම සම්බන්ධව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව ඩීඑම්එස්/0001/Vo.II හා 2017.06.17 දිනැති චක්‍රලේඛය නිකුත් කළ බවයි. එම චක්‍රලේඛය අනුව ආරක්ෂක අංශ වල නීති ක්ෂේත්‍රයේ රැකියාවලට බඳවා ගත් නීති නිලධාරීන් හට අදාළ දීමනාවට හිමිකම ලැබෙන බව දක්වා ඇත. චක්‍රලේඛයේ විධිවිධාන අනුව ත්‍රිවිධ හමුදාවන්හි නීති අංශ සඳහා සෘජුවම බඳවාගෙන ඇති නීති නිලධාරීන් හට පමණක් දීමනාව ලබාගැනීමට හිමිකම ඇති බවද පෙන්වා දී ඇත. ඒ අනුව සේවා ව්‍යවස්ථාවේ හෝ බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් සුදුසුකම් අනුව සෘජුවම නීති අංශ වල රාජකාරි සඳහා බඳවා ගත් සියළු නීති නිලධාරීන්ට මෙම දීමනාව හිමිවන නමුත් වෙනත් තනතුරකට බඳවා ගත් පසුව නීතිඥ සුදුසුකම සපුරා ඇති නිලධාරීන් නීති අංශයන්ට අනුයුක්තව සේවය කිරීම මත මෙම දීමනාවට හිමිකමක් නොලබන බව දක්වා ඇත. පෙත්සම්කාර නිලධාරියා යුද්ධ හමුදාවේ වෙනත් තනතුරකට බඳවාගෙන පසුව නීතිඥ සුදුසුකම් සපුරාලීම මත යුද්ධ හමුදා නීති අංශයට අනුයුක්තව සේවය කරන බව පෙන්වා දෙමින් සෘජුවම නීති අංශයට බඳවාගෙන නොමැති වීම ඉහත කී වෘත්තීය දීමනාව ලබාගැනීමට ඇති චක්‍රලේඛීය ප්‍රතිපාදන අනුව හිමි එකක් නොවන බව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් දක්වා ඇත.

ඒ අනුව යුද්ධ හමුදාවද ආරක්ෂක අමාත්‍යාංශයද තවදුරටත් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ තුළින් ඇති කාරණාවක් වන “සෘජුවම බඳවා ගත්” යන වචනය මත කටයුතු කරමින් ඉදිරි පියවර ගැනීමට නොහැකිව පෙත්සම්කරුට හා මෙකී දීමනාව හිමිවියයුතු යුද්ධ හමුදාවේ සිටින තවත් නීතිඥවරුන් ලෙස නීති අංශයේ කටයුතු කරන නිලධාරීන් හට වෘත්තීය දීමනාව ලබාදීම සම්බන්ධව කටයුතු කළ නොහැකිව ඉදිරි පියවර නොගෙන සිටින බව අනාවරණය වේ.

**පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-**

පරීක්ෂණ අවස්ථාවේදී වගඋත්තරකරුවන් විසින් පෙන්වා දෙන ලද්දේ, ඉහත කී කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය අනුව සෘජුවම බඳවා ගත් නිලධාරීන් හට පමණක් මෙම වෘත්තීය දීමනාව හිමි බවද පෙත්සම්කරු හා ඊට සමාන තත්ත්වයේ සුදුසුකම් ඉදිරිපත් කරමින් කරුණු දක්වන නිලධාරීන් සෘජුවම බඳවාගෙන ඇත්තේ නීති අංශයට නොවේ නම් එකී හිමිකම අහිමි වන බවය. පෙත්සම්කරු සඳහන් කර ඇත්තේ, සෘජුවම බඳවා ගන්නා ලද්දේ වෙනත් තනතුරකට වුවද පසුකාලීනව නීතීඥවරුන් ලෙස ඊට අදාළ නීති විද්‍යාල විභාග සමත් වීමෙන් අනතුරුව ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥවරුන් ලෙස දිවුරුම් දීමෙන් පසු ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නීති නිලධාරීන් ලෙස කටයුතු කරමින් තිබියදී මෙම දීමනාව අහිමි කිරීම සාධාරණ නොවන බවය. මේ වනවිට අධ්‍යක්ෂ නීති ලෙස කටයුතු කරන නිලධාරීන්වද වෘත්තීය දීමනාව ලබාදීම පැහැරහැර ඇතත්, ඔහු යටතේ සේවයේ සිටින නීති නිලධාරීන් හට වෘත්තීය දීමනාව ලබාදීම තුළින් අධ්‍යක්ෂ නීති පවා වෘත්තීය දීමනාව නොලබා තිබීම වඩාත් ගැටළු සහගත බවත් දක්වා ඇත. එමෙන්ම මේ වනවිට පැමිණිලිකරු නීතීඥවරයෙකු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දීමෙන් අනතුරුව වැඩිදුරටත් නීතිය පිළිබඳ පශ්චාත් උපාධිද සම්පූර්ණ කර ඇතත්, මෙම වෘත්තීය දීමනාව ලබාදීම සිදු නොවන අතර තම සම්පූර්ණ සේවයම යුද්ධ හමුදාව වෙනුවෙන් ලබාදෙන්නේ නීතිඥ තනතුරට අදාළව බව පෙන්වා දී ඇත. වගඋත්තරකරුවන් දන්වා ඇත්තේ, කෙසේ වෙතත් "ඍජුරාම බඳවාගත්" හෙවත් "සෘජුවම බඳවාගත්" නීති නිලධාරීන් නොවන බැවින් චක්‍රලේඛමය ප්‍රතිපාදන අනුව එකී හිමිකම අහිමි වන බවය. අනුයුක්ත කරන ලද නිලධාරීන් ලෙස නීති අංශයට අදාළව කටයුතු කළ ද මෙම හිමිකම නොමැති බව වගඋත්තරකරුවන් පෙන්වා දී ඇත.

**නිරීක්ෂණ සහ නිගමන :-**

මෙම පෙත්සමට අදාළ කරුණු සළකා බැලීමේදී පෙනී යන්නේ, පෙත්සම්කරුවන් ඉල්ලා සිටින සහනයට ආදාළ වන්නේ 2017 වසරේ අයවැය යෝජනාවක් මත රජයේ නීති නිලධාරීන් ලෙස සේවය කරනු ලබන වෘත්තිකයින් හට ලබාදීමට නියමිත වෘත්තීය දීමනාව බවය. එකී අයවැය යෝජනාවේදී දක්වා ඇත්තේ, නීතිමය කටයුතු වර්ධනය කිරීම උදෙසා ගනු ලබන තීරණයක් ලෙස වෘත්තීය දීමනාවක් රජයේ සේවයේ නියුතු නීති නිලධාරීන් හට ලබාදියයුතු බවත් එය ත්‍රිවිධ හමුදාවේ කටයුතු කරනු ලබන නීති නිලධාරීන් හටද අදාළ බවත්, ඒ සඳහා මිලියන 20ක් 2017 වර්ෂයේදී අයවැය යෝජනාව තුළින් වෙන් කර ඇති බවත්ය. එය පෙත්සම්කරු තම පෙත්සම තුළින් සහනය ඉල්ලා සිටීමට පාදක වන ප්‍රධාන ලේඛනය වේ. ඒ අනුව එකී වෘත්තීය දීමනාව 2017 වසරේ සිට ලබා නොදීම මත ද රජයේ නීති නිලධාරීන් හට මෙන්ම යුද්ධ හමුදාවේ ද තෝරාගත් නීති නිලධාරීන් කිහිප දෙනෙකුට පමණක් ගෙවීමෙන් වෙනස්කමකට භාජනය කර තිබීම පිළිබඳව පෙත්සම්කරු ශ්‍රී ලංකා නීතිඥ සංගමයට ද අයවැය දෙපාර්තමේන්තුවට ද ඉහත කී වගඋත්තරකරුවන්ට ද ලිඛිතව ඉල්ලීම් කර ඇති බව ගොනුව පරීක්ෂා කිරීමේදී පෙනී ගිය ද ඒ පිළිබඳව සහනයක් නොලැබී තිබීම මත ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත තම පෙත්සම් ගොනු කර තිබී ඇත. පෙත්සම ගොනු

කිරීමෙන් අනතුරුව කරන ලද පරීක්ෂණයේදී පැහැදිලි වන්නේ මෙම දීමනාව සඳහා හිමිකම් කියන පැමිණිලිකරු ද ඇතුළු තවත් නීති නිලධාරීන් කිහිප දෙනෙකු යුද්ධ හමුදාවේ සිටින බවත් අධ්‍යක්ෂ නීති ලෙස කටයුතු කළ ද එකී නීතිඥ සේවාව ලබාදෙන නිලධාරී වරයාට පවා මෙම වෘත්තීය දීමනාව ලබා නොදෙන බවත්ය.

ත්‍රිවිධ හමුදාවේ නිලධාරීන් හට මෙම වෘත්තීය දීමනාව සඳහා හිමිකම ලැබෙන්නේ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2017.06.07 දින නිකුත් කළ අංක ඩීඑම්එස්/0001/Vo.II දරණ චක්‍රලේඛය ප්‍රකාරව බව නිරීක්ෂණය වේ. එකී චක්‍රලේඛය තුළ ඇත්තේ සෘජුවම බඳවාගෙන ත්‍රිවිධ හමුදාවේ නීති අංශවල සේවය කරන නිලධාරීන් හට මෙම හිමිකම ලැබියයුතු බවය. එමෙන්ම මෙම හිමිකම ඉඳුරාම බඳවා නොගත් නීති නිලධාරීන් හට එනම්, වෙනත් සේවාවක් සඳහා හෝ තනතුරක් හෝ සඳහා බඳවාගත් නිලධාරීන් පසුව නීතිඥ සුදුසුකම සම්පූර්ණ කළද එකී හිමිකම හිමි නොවන බවට සඳහන් වී තිබීම පෙත්සම්කරුවන් හට මෙම සහනය නොලැබීමට හේතුවක් වී ඇති බව නිරීක්ෂණය වේ. මෙම "ඉඳුරාම" යන වචනය පෙත්සම්කරුවන් හට සහනය ලබාගැනීමට ඇති එකම බාධාව බව පෙනී යයි.

පෙත්සම්කරු විසින් ඉදිරිපත් කර ඇති ලේඛන අනුව යුද්ධ හමුදාවේ නීති නිලධාරීන් ලෙස බ්‍රිගේඩියර් තනතුරේ දෙදෙනෙකු ද කර්නල් වරුන් 12 දෙනෙකු ද ලුතිනන් කර්නල් වරුන් 08 දෙනෙකු ද මේජර් වරුන් 133ක් ද කපිතාන් වරු 26 දෙනෙකු ද සිටින බව පැහැදිලි වේ. මින් සම්පූර්ණ නීති නිලධාරීන් සංඛ්‍යාව 91ක් ද පසුව නීතිඥ වෘත්තියට ඇතුලත් වූ නිලධාරීන් සංඛ්‍යාව 04 දෙනෙක් ද කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ නීති උපාධිය ගෙන සම්බන්ධ වූ නීති නිලධාරීන් 34 දෙනෙකු ද ඉඳුරාම බඳවාගත් නීති නිලධාරීන් 53ක් ද ලෙස සිටින බව පෙනී යයි. යුද්ධ හමුදාව තුළ සේවය කරනු ලබන සියළු නිලධාරීන් හා සේවකයින්ගේ සංඛ්‍යාව හා යුද්ධ හමුදා සේවා ස්ථාන සංඛ්‍යාව සලකා බැලූවද, බොහෝ අධිකරණයන්හි පවතින නඩු කටයුතු සංඛ්‍යාව පිළිබඳ සලකා බැලූවද, නීති නිලධාරීන් ඉහත කී ප්‍රමාණය සංඛ්‍යාත්මකව සිටීමද අත්‍යවශ්‍ය එකක් බව යුද්ධ හමුදාවේ නීතිමය කටයුතු වල ඇති අවශ්‍යතාවය සලකා බැලීමේදී පැහැදිලිව පෙනී යනු ඇත. ඒ අනුව යුද්ධ හමුදාවේ පවතින නීති නිලධාරීන්ගේ අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන කටයුතු කරනු ලබන නීති අධ්‍යයන අංශයෙන් අධ්‍යාපන කටයුතු අවසන් කර නීතිවේදී උපාධිය ලබාගැනීමෙන් අනතුරුව නීතිඥ සුදුසුකම ලබාගත් අයවලුන් නීති නිලධාරී තනතුරට බඳවා ගන්නා බව පැහැදිලි වේ. මෙහිදී කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය තුළින් අධ්‍යාපනය ලබාගැනීමට ඔවුන් ඇතුලත් වන්නේ කැඩෙට් නිලධාරීන් ලෙස ය. පසුව ඔවුන් නීති නිලධාරීන් ලෙස බඳවා ගනු ලබයි. ඒ අනුව එකී නිලධාරීන් හට වෘත්තීය දීමනාව මේ වනවිට ගෙවමින් තිබෙන බව පෙනී යන අතර, වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීමට අනුව එකී නීති නිලධාරීන් ද ඉඳුරාම බඳවා ගත් නිලධාරීන් ලෙස සැලකිය නොහැකි බවට මෙහිදී තාර්කික කරුණක් මතුවේ. මන්ද පෙත්සම්කරු හා තවදුරටත් මෙම වෘත්තීය දීමනාව නොලබන නීති නිලධාරීන් බඳවා ගැනීමට අදාළ සියළු සුදුසුකම් සපුරා තිබියදී දීර්ඝ කාලයක් යුද්ධ හමුදාවේ නීති අංශයේ කටයුතු කිරීමට පත්වීමක් ලබා ක්‍රියා කරන බැවිනි.

ඒ අනුව නීති නිලධාරීන් හට යුද්ධ හමුදාවේ සළකා බලනු ලබන සියළු සුදුසුකම් හා වඩාත් වැඩි සුදුසුකම් සපුරාගෙන තිබියදී ඒ සඳහා නීති අංශය කටයුතු කිරීමට පත්වීමක්ද ලබාදී තිබියදී තවදුරටත් නීති නිලධාරීන් හට හිමිවියයුතු වෘත්තීය දීමනාව ලබාදී නොතිබීම යුක්ති සහගත නොවන බව නිරීක්ෂණය වේ. විශේෂයෙන් අධ්‍යක්ෂ නීති හට පවා වෘත්තීය දීමනාව ලබා නොදී ඔහු යටතේ සිටින නීති නිලධාරීන්ට වෘත්තීය දීමනාව ලබාදීම ද පරිපාලනමය වශයෙන් කටයුතු කිරීමේදී මානසික හිංසනයක් එකී නිලධාරීවරයා හට ඇතිවීමට හේතු වන්නක් බවද පෙන්වා දියයුතු ය. නීතිඥ වෘත්තීයට අදාළ සුදුසුකම ලබා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරුන් ලෙස දිව්රුම් දීමෙන් අනතුරුව තවදුරටත් නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ද සම්පූර්ණ කරගත් නිලධාරීන් නීති නිලධාරීන් ලෙස හා අධ්‍යක්ෂ නීති ලෙස කටයුතු කිරීමට යුද්ධ හමුදාව විසින් පත් කර තිබියදී රජයේ නීති වෘත්තිකයින්ට හිමි වෘත්තීය දීමනාව ලබා නොදීම අයුක්ති සහගත කාරණාවක් වන අතර, යුද්ධ හමුදාවේම නීති අංශයේ කටයුතු කරන යම් නීති නිලධාරීන් පිරිසකට එකී දීමනාව ගෙවීමෙන් පෙන්සම්කරු හා මෙකී දීමනාව නොගෙවන නිලධාරීන් වෙනස්කමකට භාජනය වන බව හඳුනාගතහැක.

එමෙන්ම යුද්ධ හමුදාවේ නීති නිලධාරීන් ලෙස කටයුතු කරනු ලබන අය එකී කටයුතු කරනු ලබන්නේ හුදෙක් පත්වීම් ලිපියක් මගින් නීති නිලධාරීන් ලෙස කරනු ලබන ලේඛනගත පත්වීම් ලිපියකට අනුවම නොවන බව පෙනී යන අතර, නීති සේවා අධ්‍යක්ෂක මණ්ඩලය යටතේ රාජකාරී කිරීම සඳහා රෙජිමේන්තු ගමන් නියෝගයක් මගින් සේවයට රපෝර්තු කරවීමේ ක්‍රමවේදයක් අනුව බව පෙනී යයි. එමෙන්ම කොතලාවල ආරක්ෂක විශ්විද්‍යාලයේ කෙඩෙට් නිලධාරීන් ලෙස බැදී නීති උපාධිය සම්පූර්ණ කර නීතිඥ වෘත්තීයට ඇතුලත් වූ නීති නිලධාරීන්ද නීති සේවා අධ්‍යක්ෂක මණ්ඩලයේ අතිරේක රෙජිමේන්තු සේවා පදනම මත රාජකාරි කිරීම සඳහා පත් කරනු ලබන බව පෙනී යන අතර, ඒ අනුව මෙම කෙඩෙට් නිලධාරීන් ලෙස බැදී සිටින නිලධාරීන් "ඉදුරාම" නීති සේවයට බඳවා ගත් නිලධාරීන් නොවූවද වෘත්තීය දීමනාව ගෙවනු ලබන බව පෙනී යයි. වෘත්තීය දීමනාවේ හිමිකම නොලබන එක් නිලධාරියෙකු වන බ්‍රිගේඩියර් එන්.ජේ.එන්.පී.නාගහවත්ත ආර්.එස්.පී.(නි)62337) යන අය 2012 වසරේ සිට නීති නිලධාරී ලෙස පත්ව තවදුරටත් එහි සේවය කරමින් මේ වනවිට අධ්‍යක්ෂ (නීති) ලෙස සහ වැඩ බලන විනිසුරු ලෙස කටයුතු කරන බවද නිරික්ෂණය වේ. එමෙන්ම පැමිණිල්ල ගොනු කළ ලුතිනන් කර්නල් එම්.එල්.එන්.යූ.ලියනගේ (ආර්එස්පී)නි/64306) යන අය 2010 වසරේ සිට නීති නිලධාරියෙකු ලෙස පත් කර තවදුරටත් මේ දක්වාම මාණ්ඩලික නිලධාරී I (නීති) ලෙස කටයුතු කරන බව නිරීක්ෂණය වේ. මෙකී ජ්‍යෙෂ්ඨ නිලධාරීන් යටතේ කටයුතු කරන කණිෂ්ඨ නීති නිලධාරීන් පවා වෘත්තීය දීමනාවකට හිමිකම් ලබා මෙතෙක් කල් එකී දීමනාව ලබාගත්තද ඉහත කී නීති සේවා අධ්‍යක්ෂක කටයුතු කරනු ලබන්නේ වෘත්තීය දීමනාව ලැබීමේ හිමිකම අහිමිව තිබියදී බව නිරීක්ෂණය වේ.

පත්වීම් ලිපියක් නිකුත් කරමින් නීති නිලධාරීවරයෙකු යන්න තහවුරු කිරීමේ ක්‍රමවේදයක් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නොපවතින අතර, ඉහත පරිදි නීති නිලධාරී තනතුරට අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ

පසු සම්මුඛ පරීක්ෂණයකින් තෝරාගත් නිලධාරීන් රෙජිමේන්තු ගමන් නියෝගයක් මගින් නීති අධ්‍යක්ෂ මණ්ඩලය වෙත රපෝර්තු කිරීමේ ක්‍රමවේදයක් තිබීම යුද්ධ හමුදාවේ පවතින ක්‍රමවේදය බැවින් යම් අයෙකු නීති නිලධාරීවරයෙකු ද යන්න අනාවරණය කර ගැනීමට හැකි වඩාත් සුදුසු ක්‍රමය වන්නේ ඔහු එකී සුදුසුකම් සපුරා නීති අධ්‍යක්ෂක යටතේ කටයුතු කිරීමට ඉහත පරිදි ගමන් නියෝගයක් ලබාදී තිබේද යන්න මගින් තහවුරු කර ගැනීම වේ. ඒ අනුව යුද්ධ හමුදාවේ නීති අධ්‍යක්ෂක යටතේ කටයුතු කරනු ලබන වෘත්තිය දීමනාව ලබාගන්නා නිලධාරීන් මුල් අවස්ථාවේ "ඉදුරාම" එනම්. යුද්ධ හමුදාවට බැදෙන අවස්ථාවේ නීති නිලධාරීන් නොවූවද පසුව නීති නිලධාරි තනතුරට අදාළ සුදුසුකම් සපුරා නීති අධ්‍යක්ෂක යටතේ නීති නිලධාරීන් ලෙස ස්ථිරව කටයුතු කරන පිරිසක් ලෙස සිටින බව සනාථ වේ. ඉහත කී එක් උදාහරණයක් වූ කැඩෙට් නිලධාරීන් ලෙස බැදී පසුව නීතිඥ වෘත්තියට අදාළ සුදුසුකම් සම්පූර්ණ කර නීති සේවා අධ්‍යක්ෂක යටතේ කටයුතු කරනු ලබන නිලධාරීන් සිටීම හා වෘත්තීය දීමනාව ලබාගැනීම මීට හොදම නිදසුනක් ලෙස පෙන්වා දියහැක. එයට හේතුව වන්නේ කලමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් රජයේ නීති වෘත්තිකයින් හට මෙම දීමනාව ලබාදීමට අදාළ චක්‍රලේඛය නිකුත් කිරීමේදී ත්‍රිවිධ හමුදාව සම්බන්ධ නීති නිලධාරීන් පිළිබද කරුණු දැක්වීමේදී "ඉදුරාම බදවාගත්" යන වචනය ඇතුලත් කිරීම තුලින් 2017 අයවැය යෝජනාව ප්‍රකාශයට පත් කරමින් ප්‍රකාශිත අයවැය යෝජනාවේ තීරණය පටු කොට දැක්වීමට ගත් "ඉදුරාම" යන වචනයේ බලපෑම බව නිරීක්ෂණය වේ.

ඒ අනුව වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපයන් මත පෙත්සම්කරුගේද, ඊට සමගාමීව මෙම දීමනාව නොලබන නීති නිලධාරීන්ගේද 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදුව ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව, වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පෙත්සම්කරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදුව ඇති බවට අනාවරණය වී තිබීම මත නීති නිලධාරීන් ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ නීති අංශයට අනුයුක්තව සේවය කිරීමට පත් කරන ලද පෙත්සම්කාර ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරුන් හට 2017 අයවැය යෝජනාව ප්‍රකාරව හිමිවියයුතු වෘත්තිය දීමනාව එකී ගෙවීම ආරම්භ වූ නියමිත දින සිට ලබාදීමට කටයුතු කළයුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023. 03 . 27 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධ පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු)
සභාපතිනී
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Justice Rohini Marasinghe
Judge of the Supreme Court (Retired)
Chairperson
Human Rights Commission of Sri Lanka

A. Shanmuganathan

~~අනුසූයා ෂන්මුගනාදන්.~~
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

පිටපත =: අමාත්‍යතුමා,
ආරක්ෂක අමාත්‍යංශය,
කොළඹ 01

B/